## භාෂා ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය – දෙමාපියන් සඳහා තොරතුරු

WACE භාෂා පාඨමාලාවක් සඳහා ඇතුළත් වීමට කැමති සියලුම සිසුන් *WACE භාෂා පාඨමාලාවක්* සඳහා පාසල් විෂයමාලා හා ප්‍රමිති අධිකාරියට (අධිකාරියට) ඇතුළත් වීමට අවසර සඳහා මාර්ගගත අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

මාර්ගගත අයදුම්පත ඔවුන් 10* වසරෙහි සිටින විට සිසුන් විසින් පුරවනු ලැබේ.

මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා, සිසුන්ට නිවසේදී හෝ පාසලේදී පරිගණකයක් භාවිත කිරීමට සිදු වෙයි. ඔබට කිසියම් ප්‍රශ්නයක් ඇත්නම්, ඔබට උදවු කිරීමට ඔබේ දරුවාගේ භාෂා ගුරුවරයාගෙන් හෝ පාසල් පරිපාලනයෙන් විමසන්න.

## අවශ්‍ය තොරතුරු

ඔබේ දරුවාට පහත තොරතුරු සැපයීමට සිදු වෙයි:

- පෙර පාසලේ සිට සෑම පාසල් වර්ෂයක් සඳහාම සහභාගී වූ පාසල් පිළිබඳ විස්තර
- විදෙස් පාසලට / පාසල්වලට සහභාගී වූ වසර සඳහා පාසල් වාර්තාව / වාර්තා
- පෙර වාසය කළ රටවල්
- පෙර සංචාරය කළ රටවල්
- රටවල සංචාරය කිරීම සඳහා හේතුව / හේතු
- රටවල සංචාරවල කාලය
- ශිෂ්‍යයා කථා කිරීමට ඉගෙන ගත් පළමු භාෂාව / භාෂා
- ශිෂ්‍යයාට කථා කිරීමට, කියවීමට හා ලිවීමට හැකි වෙනත් භාෂා / භාෂාව
- ශිෂ්‍යයා ඔවුන්ගේ දෙමව්පියන් / භාරකරුවන් / සහෝදරයන් සහ සහෝදර සහෝදරියන් හා මිතුරන් සමඟ කථා කරන භාෂා / භාෂාව

## සහය ලියකියවිලි

ඔබේ දරුවාට පහත ලියකියවිලි වල ඡායාරූපයක් හෝ ස්කෑන් පිටපතක් ලබා දීමට සිදු වේ:

- දෙමාපිය/ භාරකරු දැනුවත්භාවය පිළිබඳ පෝරමය (අනිවාර්ය)
- අදාළ නම් විදේශ ගමන් බලපත්‍ර හඳුනා ගැනීමේ පිටුව
- අදාළ නම් ජාත්‍යන්තර ගමන් වාර්තා/ වාර්තාව
- අදාළ නම් විදෙස් පාසල් වාර්තාව/ වාර්තා

අයදුම්කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු අධිකාරියේ වෙබ් අඩවියේ සඳහන් වේ https://senior-secondary.scsa.wa.edu.au/syllabus-and-support-materials/languages.

* 11 වසර භාෂා පාඨමාලාවක් හැදෑරීමට අයදුම් කරන 9 වන වසරේ සිසුන්ට ද මෙය අදාළ වේ.